# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2177/8 - 2020 මැයි මස 27 වැනි බදාදා - 2020.05.27**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1973 අංක 25 දරන ක්‍රීඩා පනත**

1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 31 වැනි වගන්තිය සමග කියවිය යුතු 41 වැනි වගන්තිය යටතේ ක්‍රීඩා අමාත්‍යවරයා සාදන ලද නියෝග.

ඩලස් අලහප්පෙරුම,
අධ්‍යාපන, ක්‍රීඩා හා තරුණ කටයුතු අමාත්‍ය.

2020 මැයි මස 26 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. 2020 මාර්තු මස 10 වැනි දින නිකුත් කරන ලද අංක 2166/9 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද සංශෝධිත ජාතික ක්‍රීඩා සංගම් නියෝග පහත සඳහන් පරිදි 2020 වර්ෂයට අදාළව පමණක් සංශෝධනය කරනු ලැබේ.

   අංක 04 අයිතමයේ 5 (4) (න) වගන්තියේ අංක 1 හා 111 වගන්තිවල සඳහන් "මූල්‍ය වර්ෂය අවසන්වී මාස දෙකක් ඇතුළත" යන වචනය වෙනුවට "මූල්‍ය වර්ෂය අවසන්වී මාස 06ක් ඇතුළත" යනුවෙන් 2020 වර්ෂයට ඉදිරිපත් කළයුතු 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළව පමණක් සංශෝධනය කරනු ලැබේ.

   අංක 09 අයිතමයේ "යථෝක්ත කමිටුව පත්කළ දින සිට දින 30ක් ඇතුළත" යන වචන ඉවත් කොට "නිළවරණය පැවැත්වීමට නියමිත දිනයට දින 75කට පෙර" යනුවෙන් 2020 වර්ෂයට අදාළව පමණක් සංශෝධනය කරනු ලැබේ.

   එමෙන්ම 2021 වර්ෂයේ ජනවාරි මස පළමු වන දින සිට ඉහත සඳහන් සංශෝධනයන් අවලංගුවන අතර නැවතත් 2021 ජනවාරි මස පළමු වන දින සිට සියලුම ජාතික ක්‍රීඩා සංගම් සිය විධායක කමිටුව විසින් සහතික කරන ලද මූල්‍ය ප්‍රකාශනය එක් එක් මූල්‍ය වර්ෂය අවසන්වී මාස දෙකක් ඇතුළත විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළයුතු අතර නිළවරණ කමිටුව පත්කළ දින සිට දින 30ක් ඇතුළත නිළවරණ කමිටුව විසින් ඡන්දදායක (ඡන්දය හිමි අනුබද්ධ ආයතන) නාමලේඛනය පිළිබඳ කටයුතු නිම කොට ජාතික ක්‍රීඩා සංගමයේ සියලු සාමාජිකයින්ට දැන්විය යුතුය.


1A - G 032271 — 27 (2020/05)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

2. 2018 සැප්තැම්බර් මස 22 වැනි දින නිකුත් කරන ලද අංක 2089/56 දරන *අති විශෙෂ ගැසට්* නිවේදනය මගින් නිකුත් කරන ලද නියෝගයන්හි අංක 3 (ඈ) වගන්තියේ "පත්වීම් දින සිට මාස 02කට නොඅඩු කාලයක් තුළ" යන වචන ඉවත් කොට 2020 වර්ෂයට අදාළව පමණක් "නිළවරණය පැවැත්වීමට නියමිත දිනයට දින 55කට පෙර නිළවරණය කැඳවීම සිදුකළ යුතුය" යනුවෙන් සංශෝධනය කරනු ලැබේ. 2021 වර්ෂයේ ජනවාරි මස පළමුවන දින සිට නැවතත් 2018 සැප්තැම්බර් මස 22 වන දින නිකුත් කරන ලද අංක 2089/56 දරන *අති විශෙෂ ගැසට්* නිවේදනයේ පළකරන ලද ජාතික ක්‍රීඩා සංගම් නියෝගයන්හි අංක 3 (ඈ) වගන්තිය ක්‍රියාත්මක වේ.

06 - 38

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.